# ජල සම්බන්ධනයක් සඳහා අයදුම් පත්‍රය පිරවීම සහ ජල සම්බන්ධනය ලබා ගැනීම පිණිස උපදෙස්

**A. අයදුම් පත්‍රය පිරවීමේදී පහත උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලමි.**

A1. අයදුම්කරුගේ සම්පූර්ණ නම සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවෙන් සහ ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පැහැදිලිව ලියන්න.

A2. ජල සම්බන්ධනය අවශ්‍ය ස්ථානයේ ලිපිනය, සහ වෙනස් ස්ථානයක ස්ථිර පදිංචි වී සිටින්නේ නම් එහි ලිපිනය සඳහන් කරන්න. ජල සම්බන්ධනය අයදුම් කරන්නාගේ ජංගම දුරකථන අංකය , නිවසේ දුරකථන අංකය සහ ඊමේල් ලිපිනය (ඔබේ නම් පමණක්) සඳහන් කරන්න.

ලිපිනය තහවුරු කිරීම සඳහා, ඔබගේ ජාතික හැඳුනුම්පත් ලිපිනය ජලය ඉල්ලුම්කරන ස්ථානයේ ලිපිනයම වේ. එහි පිටපතක් හෝ, ග්‍රාම නිලධාරි සහතිකය හෝ, වර්ෂයට අදාල වරිපනම් දැන්වීම (වරිපනම් අංකය තැපැල් අංකයම වේ නම්) හෝ, අයදුම්කරු නමින්ම ඇති විදුලි බිල්පතක් ඉදිරිපත් කරන්න.

A3. අයදුම්කරු ජල සම්බන්ධනය අවශ්‍ය කරන ස්ථානයේ නිත්‍යානුකූල අයිතිකරු නොවේ නම්, ඒ සඳහා ආපසු නොගෙවන තැන්පතු මුදලක් මණ්ඩලයට ගෙවිය යුතුය. තවද, අයදුම්කරු ජල සම්බන්ධනය ඉල්ලුම් කරන ස්ථානයේ අයිතිකරු නොවන අවස්ථාවලදී ඉල්ලුම්කරු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතු වේ. අදාල පෝරමය කාර්යාලයෙන් ලබා ගත හැක.

A4. අයදුම්කරු සමෘද්ධිලාභියෙකු නම් සමෘද්ධි කළමනාකරු සහතික කල සමෘද්ධි කාඩ්පත් අංකය සහ වලංගු දිනය සඳහන් කරන්න. සමෘද්ධිලාභියෙකු බව තහවුරු කිරීමට සහ ලිපිනය තහවුරු කිරීමට අදාල වර්ෂයේ ලිපි ලේඛන ඉදිරිපත් කල යුතුය.

A5. මෙම ස්ථානයට මීට ඉහතදී ජල සැපයුමක් ලබා ගෙන ඇත්නම් එම විස්තරය අනිවාර්යෙන්ම ඉදිරිපත් කල යුතුය. දෙවන ජල සැපයුම සඳහා සියළුම හිග ජල ගාස්තු ගෙවා නිරවුල් කිරීමේ සහතිකය ලබා ගත යුතුය.

A6. ජල සම්බන්ධනය ඉල්ලුම් කරන්නේ ප්‍රජා මූල සංවිධානය හා බද්ධව ක්‍රියාත්මක වන ප්‍රදේශයක නම් ඒ බව සඳහන් කර ප්‍රජා මූල සංවිධානයේ එකඟතාවය ලබා ගත් ලිපිය ඉදිරිපත් කල යුතුය.

A7. ජල සම්බන්ධනය ලබා දීමට අවශ්‍ය වන නියමිත ගැඹුර සහිත දිග ප්‍රමාණයට කාණු කැපීම හා වැසීම අයදුම්කරු සිදු කරන්නේ ද , නැද්ද යන්න පැහැදිලිව සඳහන් කල යුතු වේ. එසේ නොවන්නේ නම්, ඒ සඳහා වන වියදම් මණ්ඩලය විසින් සිදු කරන සේ සලකා එයට අදාල මුදල ඇස්තමේන්තුවට ඇතුලත් කරනු ලැබේ.

A8. ජල සම්බන්ධනය අවශ්‍ය ස්ථානය සොයා ගැනීම සඳහා පැහැදිළි රූප සටහනක් අඳින්න. අවශ්‍ය නම්, වෙනම රූප සටහන් අමුණන්න. යාබද නිවසේ සැපයුමක් තිබේ නම් එහි ගිණුම් අංකය සඳහන් කිරීම ඔබගේ ස්ථානය හඳුනා ගැනීමට පහසුවක් වනු ඇත.

A9. ජල සැපයුම ලබා ගන්නා ස්ථානයේ පිහිටීම තහවුරු කර ගැනීම සඳහා ඛණ්ඩාංක (GPS Coordinates) අදාල වගුවේ සඳහන් කරන්න. ඛණ්ඩාංක ලබාගැනිම පිළිබඳ උපදෙස් පත්‍රිකාව මේ සමග අමුණා ඇත..

ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දී ලදුපත ලබා ගැනීමට කටයුතු කරන්න.

**B. ජල සම්බන්ධනය ලබා ගැනීමේදී පහත උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලමි.**

B1. ඔබගේ අයදුම් පත්‍රය අනුව මණ්ඩලය විසින් ඇස්තමේන්තුවක් සහිත ගෙවීම්පත, ජල සම්බන්ධන ලබා දීමේදී සිදු වන මාර්ගය පළුදු කිරීම සම්බන්ධ විස්තර ඇතුලත් පත්‍රිකාව, ජල සම්බන්ධනය ලබා ගැනීමේදී මණ්ඩලය සමග එළඹිය යුතු ගිවිසුම් පත්‍රිකාව ඔබ වෙත ලබා දෙනු ඇත.

I. මාර්ගය පළුදු කිරීම සම්බන්ධ විස්තර ඇතුලත් පත්‍රිකාව අදාල මාර්ගය නඩත්තු කරන ආයතන වෙත ඉදිරිපත් කර මාර්ගයට සිදු වන හානි සඳහා ගෙවිය යුතු මුදල එම ආයතනයට ගෙවිය යුතුය.

ඉහත ගෙවිම සිදු කර අදාල ගෙවීම් පත්‍රිකාව සහ මාර්ගය පළුදු කිරීම සඳහා අදාල මාර්ගය නඩත්තු කරන ආයතනය ලබා දුන් අවසර පත්‍රිකාව මණ්ඩලයේ අදාල කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය.

II. ජල සම්බන්ධනය ලබා ගැනීම සඳහා මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල් අදාල වවුචරයේ සඳහන් ස්ථානයට ගෙවිය යුතුය.

B2. ජල සම්බන්ධනය ලබා ගැනීමේදී මණ්ඩලය වෙත එළඹිය යුතු ගිවිසුම් අත්සන් කිරීම සඳහා අදාල ජල පාරිභෝගිකයා නොපැමිණෙන්නේ නම්, සාමදාන විනිශ්චකාරවරයෙකු /දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් සහතික කර හා සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපිට අත්සන් කර මණ්ඩලයේ අදාල කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය.

B3. ජල සම්බන්ධනය ලබා ගැනීමේදී ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් ගෙවිය යුතුය. (මෙම මුදල අයදුම්කරුට ජල සැපයුම අවශ්‍ය නොවන අවස්ථාවක ජල සැපයුම ප්‍රධාන නළයෙන් විසන්ධි කර ගිණුම අවලංගු කර ආපසු ලබා ගත හැක).

B4. ජල සම්බන්ධනය ලබා දෙනුයේ පරිශ්‍රයට අදාල පිවිසුම් මාර්ගයෙන් සහ පරිශ්‍රයට පිවිසුම පටන් ගන්නා ප්‍රධාන ස්ථානයෙන් පමණි (උදා. ප්‍රධාන ගේට්ටුව). වෙනත් ඉඩමක් හෝ මාර්ගයක් හෝ ස්ථානයක් හරහා ලබා නොදේ.

B5. සාමාන්‍යයෙන් ගෘහ ජල සම්බන්ධනය ලබා දෙනුයේ අඟල් ½ (මිමි 20) විශ්කම්භයෙන් යුතු නල මගින් වන අතර, අයදුම්කරුගේ ඉල්ලීම සහ තාක්ෂණික හැකියාව මත අඟල් ¾ (මිමි 25) විශ්කම්භයෙන් යුතු ජල සම්බන්ධන ලබා දීමට සලකා බැලිය හැක. ජල මනුව සවි කිරීම සඳහා අවශ්‍ය කරන කුළුණ ඔබ විසින් ඉදි කර ගත යුතුය/ එසේ නොමැති නම් එය ඇස්තමේන්තුවට ඇතුළත් කල හැකිය. මේ සඳහා උපදෙස් අදාල කාර්යාලය මගින් ලබා දෙනු ඇත.

B6. එකවර ගෙවීමේ අපහසුතා තිබේ නම්, වාරික ගෙවීමේ පහසුකම් ඇති අතර, කුලියට හෝ බද්දට පදිංචි වී සිටින්නන් හට ඇස්තමේන්තු මුදල වාරිකව ගෙවීමේ පහසුකම් හිමි නොවනු ඇත.

B7. මණ්ඩලය මඟින් ජලය සපයනු ලබන්නේ ජල මණුව දක්වා පමණි. පරිශ්‍රය තුල ජලය බෙදා හැරීමේ පද්ධතිය අයදුම්කරු විසින් නිසි පරිදි සකසා ගත යුතුයි. මණ්ඩලයේ ජලය බෙදා හැරීම් පද්ධතියේ නිසි ක්‍රියාකාරීත්වයට අදාල මෙහෙයුම් කටයුත්තක් හෝ අළුත්වැඩියා කටයුත්තක් හෝ අනිකුත් කිනම් අත්දමක අත්‍යාවශ්‍ය යයි හඳුනා ගනු ලබන කාර්යයන් සඳහා ජල සැපයුම තාවකාලිකව අත්හිටුවීමට මණ්ඩලයට සිදුවන බැවින්, එවැනි අවස්ථාවන් සඳහා තම දෛනික පරිභෝජනයට සමාන ජලය දෛනිකව ගබඩා කර ගැනීමේ පහසුකම් අයදුම්කරු විසින් සකසා ගැනීමට කටයුතු කල යුතු වේ.

B8. මේ සම්බන්ධව ඔබට අමතර ගැටළුවක් වේ නම්, ලදුපතෙහි සඳහන් දුරකථන අංකයට අමතා වැඩි විස්තර දැන ගැනීමට කාරුණික වන්න.

පිරිසිදු පානීය ජලය අරපිරිමැස්මෙන් භාවිතා කර, තවත් අයෙකුට බීමට ජලය සැපයීමට සහාය වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.